# දැනුම ආර්ථිකය උදෙසා අධ්‍යාපනය

රෝලන්ඩ් අබේපාල

වර්තමාන ලෝකය කෘෂි ආර්ථිකයක් ද, මිශ්‍ර ආර්ථිකයක් ද, කාර්මික ආර්ථිකයක් ද ක්‍රමයෙන් පසුකරමින් නවතම ආර්ථිකයට පිවිස ඇත. එනම්, දැනට ම ද බොහෝ රටවල වර්ධනය වෙමින් පවත්නා ''දැනුම ආර්ථිකයයි''. ලොව පුරා රටවල් මෙම දැනුම ආර්ථිකයට සම්බන්ධ වීම සඳහා අද පියවර ගනිමින් සිටිති.

ඕනෑම ආර්ථිකයක් තුළ, රටක් සංවර්ධනය වීමට නම්, ශක්තිමත් ප්‍රාග්ධනයක් තිබිය යුතු ම ය. මෙතෙක් ලොව පුරා සෑම රටක් ම ගොඩනගා ගැනීමට උත්සාහ ගත්තේ මූල්‍ය ප්‍රාග්ධනය යි. එහෙත් දැනුම ආර්ථිකය තුළ වටිනාම ප්‍රාග්ධනය වනුයේ මානව ප්‍රාග්ධනයයි. එනම් සාක්ෂරතාවෙන් ද, නව දැනුමෙන් ද, නම්‍යශීලී චින්තනයෙන් සහ නිර්මාණශීලීභාවයෙන් ද සමන්විත මානව සම්පතකි. නැතිනම් මානව ප්‍රාග්ධනයකි. මෙතෙක් පැවැති ආර්ථිකය තුළ මුල් තැනක් ලැබුණේ ''හස්ත ශ්‍රමය''ට ය. (Manual labour), දැනුම ආර්ථිකය තුළ ප්‍රධාන ස්ථානය ලැබෙනුයේ ''මස්තිෂ්ක ශ්‍රමය'' (Brain Labour) ට ය.

දැනුම ආර්ථිකයක් තුළ ප්‍රධාන කාර්යය වනුයේ දැනුම නිෂ්පාදනය කරමින්, බෙදාහරිමින්, එය අපගේ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රයෝජනයට ගැනීම ය. ඒ අනුව දැනුම, ආර්ථිකයක් තුළ ප්‍රධාන නිෂ්පාදනය ද අපනයන භාණ්ඩය සහ ආනයන භාණ්ඩය ද වනුයේ ''දැනුම'' ය. එනම් නව ඩිජිටල් යුගයට තොරතුරු තාක්ෂණික පරිගණක යුගයට අවශ්‍ය දැනුම ය. රටකට, සාර්ථකව දැනුම් ආර්ථිකයට සහභාගි වීමට හැකිවීමට නම් පහත සඳහන් අත්‍යවශ්‍ය කුළුනු හතර සම්මත වශයෙන් ම ගොඩනගා ගත යුතුවෙයි.

- අධ්‍යාපනය සහ පුහුණුව - දැනුම නිර්මාණය කර, බෙදාගනිමින්, ප්‍රයෝජනයට ගැනීමට නම් උගත් කුසලතා සහිත ජනතාවක් සිටිය යුතු ය.

- තොරතුරු යටිතල ව්‍යූහය - තොරතුරු ඵලදායී අයුරින් සන්නිවේදනය, පතුරුවා හැරීම සහ සැකසීම පහසු කරනු සඳහා, ගුවන්විදුලියේ සිට අන්තර්ජාලය දක්වා පරාසයක විහිදුණු ප්‍රබල තොරතුරු යටිතල පහසුකම් ව්‍යුහයක් ගොඩනගා ගත යුතු වෙයි.

- ආර්ථික අනුබලය සහ ආයතනික රජයනය - දැනුමෙහි නිදහස් ගලනය පහසු කරන්නා වූ ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙහි (ICT) ප්‍රයෝජනයට ආධාර කරන්නා වූ සහ ව්‍යවසායකත්වය දිරිගන්වන්නා වූ ද, නියාමන සහ ආර්ථික පරිසරයක් අවශ්‍ය ය.

- නවීකරණ පද්ධති - වර්ධනය වෙමින් පවත්නා ගෝලීය දැනුම ස්කන්ධයෙන් දැනුම උරාගෙන ග්‍රහණය කරගනිමින් එය අපගේ අවශ්‍යතාවනට උචිත අයුරින් සකසා ගෙන නව දැනුම නිර්මාණය කිරීම සහ පර්යේෂණ මධ්‍යස්ථාන විශ්වවිද්‍යාල, චින්තන ගබඩා, පුද්ගලික ව්‍යාපාර සහ ප්‍රජා කණ්ඩායම්වලින් සමන්විත එකම ජාලයක් අවශ්‍ය ය.

ඒ අනුව දැනුම් ආර්ථිකයක් තුළ විශාලතම ආයෝජනය සිදු කෙරෙන්නේ මානවයාගේ අධ්‍යාපනය වෙනුවෙනි. ප්‍රාථමික තලයේ සිට ද්විතීයික තලයේ අවසානය දක්වා සියලුම ළමයින්ට පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම හැකි උපරිම ප්‍රතිශතයකට පශ්චාත් ද්විතීයික උසස් අධ්‍යාපනය හෝ වඩාත් විශේෂිතව තෘතීය අධ්‍යාපනය සඳහා අවස්ථා සලසා දිය යුතු වෙයි. දැනට ශ්‍රම බලකායෙහි සිටින ප්‍රමාණවත් පාසල් අධ්‍යාපනයක් නොලද සියලු ම ශ්‍රමිකයන්ට සාක්ෂරතාව ඇතුළු වැඩිදුර අධ්‍යාපනය ද, යාවජීව අධ්‍යාපනය ද සඳහා සේවාස්ථ පහසුකම් සලසාදී ම ද අවශ්‍ය ය. දැනුම ආර්ථිකයට අවශ්‍ය වන දැනුම නොකඩවා නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබෙනුයේ එවිට ය. දැනුම ආර්ථිකයට සහභාගි වීමට සූදානම් වන සියලු ම රටවල් අඩු හෝ වැඩි වශයෙන් මෙම කාර්යය දැන් සිදු කරගෙන යමින් ඇත.

දැනුම ආර්ථිකය තුළ ප්‍රධාන අපනයනය වන්නේ දැනුම ය. එනම් මොළ ශ්‍රමිකයන් ය. ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ ආසියාතික සහ අප්‍රිකානු රටවල් අද අපනයනය කරමින් සිටින්නේ හස්ත ශ්‍රමිකයන් ය. දැනුම ආර්ථිකය ගොඩනගා ගත් පසු ඒ වෙනුවට දක්ෂ පරිගණක ශිල්පීන්, ඩිජිටල් කාර්මිකයන් සැලසුම්කරුවන් මෙන්ම වාස්තු ශිල්පීන් හා ඉන්ජිනේරුවරුන් ද අපනයන වනු ඇත. සෑම රටක් ම දැනුම ආර්ථිකය ගොඩ නගාගත් පසුව, හස්ත ශ්‍රමිකයන් අවශ්‍ය නොවනු ද ඇත.

ලෝක බැංකුව ද, සංවර්ධනය වෙමින් පවත්නා රටවල විවිධ මට්ටමේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ආධාර කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නගමින් සිටින්නේ දැනුම ආර්ථිකය සඳහා අවශ්‍ය උගත් ලෝක ජනතාවක් බිහිකරනු පිණිස ය.

## දැනුම ආර්ථිකය හා අධ්‍යාපනය

පිළිවෙළින් කෘෂි ආර්ථික යුගය ද, කාර්මික යුගය සහ පශ්චාත් කාර්මික යුගය ද පසුකරමින්, ලෝකය දැන් එළඹ සිටින්නේ දනුම මුල්කරගත් ආර්ථික යුගයකට ය. මෙම දැනුම ආර්ථිකය තුළ රටක සංවර්ධනයට මුල්වන ප්‍රධාන සාධකයක්ව ඇත්තේ දැනුම නිෂ්පාදනය කරමින් එය ප්‍රයෝජනය ගැනීමේ හැකියාව ය. එනම්, ඉහළ මට්ටමේ කුසලතාවන්ගෙන් යුත්, නම්‍යශීලී මානව ප්‍රාග්ධනයක් ගොඩනගා ගැනීම ය. ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවත්නා ගෝලීය වෙළඳපොළ සමඟ තරඟ වැදීමට රටකට හැකිවන්නේ එවැනි මානව ප්‍රාග්ධනයක් ගොඩනගා ගැනීමෙන් පමණකි. නව යුගයට අවශ්‍ය මෙම අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා ලෝක බැංකුව සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ආධාර කරයි. එම ආයතනයේ අරමුණු ලෙස සඳහන් කෙරෙන්නේ, ප්‍රබල මානව ප්‍රාග්ධන ගබඩාවක් නිර්මාණය කිරීම මේ සඳහා ශ්‍රම බලකායේ බහුතර කොටසකට ඉහළ මට්ටමක කුසලතා බෙදා දීමට සමත් අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍ය ය. පවත්නා ශ්‍රම බලකායට අයත් ද්විතීයික හෝ තෘතියික අධ්‍යාපනය හෝ නොලද සාමාජිකයන් සඳහා යාවජීව (life-long) ඉගෙනීමේ පහසුකම් සලසාදීම එහි දී ඉතා වැදගත් වෙයි.

ජාතික නවීකරණ ක්‍රම පද්ධතියක් (National innovation systems) නිර්මාණය කිරීම යනු, ගෝලීය දැනුම දේශීය අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් ප්‍රයෝජනයට ගනිමින් නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා කැපවී ඒකාබද්ධ ව කටයුතු කරන ව්‍යාපාරික ආයතන, පර්යේෂණ මධ්‍යස්ථාන විශ්වවිද්‍යාල සහ චින්තන ගබඩා (Think tanks) ජාලයකි. එමගින් මුල් තැනක් ලැබිය යුත්තේ තෘතීය අධ්‍යාපනය වෙත ය. ලෝක බැංකුවෙහි එම අරමුණු මුදුන්පත් කර ගැනීම පිණිස පහත සඳහන් අධ්‍යාපන අංශ වැඩි දියුණුවට ආධාර සැපයෙයි.

1. ද්විතීයික අධ්‍යාපනය - යුගයට අවශ්‍ය නව කුසලතා ඇති කර ගැනීමට සමත්, නීරෝගී දක්ෂතා සහිත ශ්‍රම බලකායක් සඳහා පදනම වනුයේ ද්විතීයික අධ්‍යාපනය යි.

2. තෘතීය අධ්‍යාපනය - දැනුම නිපදවීමට සහ උපයෝගීකර ගැනීම සඳහා අවශ්‍ය බුද්ධිමය ශක්‍යතාව නිර්මාණය කෙරෙන්නේ තෘතීය අධ්‍යාපනය ඔස්සේ ය.

3. යාවජීව අධ්‍යාපනය - ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලබා දෙමින් වෙනස් වන වෙළෙඳපොළ ඉල්ලුම්වලට අනුගතවීමට රටකට උපකාරී වන්නේ මෙම අධ්‍යාපනය යි

දැනුම ආර්ථිකය යනු, ස්පර්ශීය සහ අනස්පර්ශීය අගයන් උත්පාදනය කර ගැනීම සඳහා දැනුම ප්‍රයෝජනයට ගැනීම ය. තාක්ෂණය විශේෂයෙන් ම දැනුම තාක්ෂණය මානව දැනුමෙන් කොටසක් යන්ත්‍ර බවට පත් කර ගැනීම සඳහා උපකාරී වෙයි. තාක්ෂණය නොමැතිව වුව ද දැනුම ආර්ථිකය ගොඩනගා ගත හැකි ය.

## සංකල්ප (Concepts)

දැනුම ආර්ථිකයෙහි ප්‍රධාන සංකල්පයක් නම්, දැනුම සහ අධ්‍යාපනය (බොහෝ විට 'මානව ප්‍රාග්ධනය ලෙසින් ද හැඳින්වෙයි) පහත සඳහන් දෙකින් එකක් ලෙස සලකනු ලැබිය හැකි වීම ය. ව්‍යාපාරික භාණ්ඩයක් - අධ්‍යාපනික සහ නවීකරණීය බුද්ධිමය

නිෂ්පාදනයක් සහ සේවාවන් ඉහළ ප්‍රතිලාභ සහිතව අපනයනය කළ හැකි හෙයිනි. ඵලදායී සම්පතක් - දැනුම ආර්ථිකයක ප්‍රධාන සංරචකය වනුයේ භෞතික ආදානයන්ට (Inputs) සහ ස්වභාවික සම්පත්වලට වඩා බුද්ධිමය ශක්‍යතා මත තැබෙන වැඩි විශ්වාසය යි.

දැනුම ආර්ථිකයෙහි මූලික පදනම හඳුන්වා දෙන ලද්දේ පීටර් ඩ්‍රකර් (Peter Drucker, 1966) විසින් ලියා පළකරන ලද "The Effecive Executive" නමැති ග්‍රන්ථය මගිනි. (හස්ත ශ්‍රමිකයා) Manual worker සහ (ඥාන ශ්‍රමිකයා අතර ඇති වෙනස ඩ්‍රකර් මෙම ග්‍රන්ථයෙන් පැහැදිලි කරයි.)

- හස්ත ශ්‍රමිකයා තම දෑතින් වැඩකර භාණ්ඩ සහ සේවා නිපදවයි.
- ඥාන හෙවත් දැනුම ශ්‍රමිකයා දෑතින් නොව, හිසෙන් වැඩකර, කල්පනා, දැනුම සහ තොරතුරු නිපදවයි.

**පරිණාමය (Evalution)**

ගෝලීය ආර්ථිකය ප්‍රතිව්‍යුහකරණයේ නවතම අවධිය ලෙස දැනුම ආර්ථිකය සැලකෙයි. මේ දක්වා කෘෂි ආර්ථිකයෙන් කාර්මික ආර්ථිකයකට ද ඉන් පසු පශ්චාත් කාර්මික යුගයකට ද මෑතක සිට දැනුම ආර්ථිකයකට ද ලෝකය සංක්‍රාන්ති වී සිටියි. මෙම නවතම අවධියේ විශේෂ ලක්ෂණ වන්නේ නවීකරණයට විශේෂ තැනක් අත්වීම ය. එබැවින් දූනුම ආර්ථිකය අද ලොව අංක 1 හිමිකර ගත් සංකල්පයක් බවට පත් වී තිබේ.

දැනුම ආර්ථිකය තුළ ක්‍රියාකාරී විශේෂඥ ශ්‍රම බලකාය පරිගණක සාක්ෂරතාවෙන් යුක්තය. මනා පුහුණුවක් සහිත ය. ක්‍රියාවලී සහ පද්ධති නවීකරණයට දක්ෂ ය. මෙම ආර්ථිකය තුළ වැදගත් වන්නේ සාපේක්ෂ වාසිය නොව තරඟකාරී වාසිය යි. ඒ සඳහා පරිගණක විද්‍යාඥයන්, ඉන්ජිනේරුවන්, රසායන විද්‍යාඥයන්, ජීව විද්‍යාඥයන්, ගණිතඥයන් සහ නව නිපැයුම්කරුවන් වැඩි වැඩියෙන් අවශ්‍ය කරයි. පර්යේෂණ සිදුකිරීම ප්‍රධාන තැනක් ගනී. එසේම එය සිය ගම් බිම් රටවල් මට්ටමින් ඔබ්බට ගෝලීයකරණ සංකල්පය අර්ථවත් කරයි. එබැවින් ගෝලීයකරණය දූනුම ආර්ථිකයේ අනිවාර්ය ලක්ෂණයකි.

දැනුම ආර්ථිකයෙන් පසු ඊළඟට එළඹෙනු ඇත්තේ ජාල ආර්ථිකය (Network economy) යැයි අදහස් කෙරෙයි. ජාල ආර්ථිකය පරිණාමය වී මනාව අන්තර් සම්බන්ධිත වූ ආර්ථිකයක් තුළ මිනිසුන්ගේ ආශාවන් සන්තෘප්ත කිරීම කෙරෙහි අවධානය යොමුවීම මගින් ආශා මූලික ආර්ථිකයක් (Passion pased Economy) නිර්මාණය වනු ඇතැයි උපකල්පනය කෙරෙයි.

**මෙහෙයුම් බලවේග (Driving Forces)**

විචාරකයන් පෙන්වා දෙන පරිදි, ව්‍යපාරයන් හි නියමයන් සහ ජාතික තරඟකාරීත්වය වෙනස් කරවන බලවේග මේවා ය.

- ගෝලීයකරණයඃ වෙළඳ පොළ සහ භාණ්ඩ වඩාත් ගෝලීය වෙයි. ගෝලීයකරණය නිසා දැනුම ආර්ථිකය සංවර්ධනය වන අතර, දැනුම ආර්ථිකයෙන් ගෝලීයකරණය වේගවත් වෙයි. මේ සංකල්ප දෙක අන්‍යෝන්‍යකාරකව ක්‍රියාත්මක වෙයි.

- තොරතුරු තාක්ෂණයඃ එය පහත සඳහන් සාධක හා සම්බන්ධිත ය. තොරතුරු/දැනුම තීව්‍රතාව කාර්යක්ෂම නිෂ්පාදනයන්ට මුල් වන්නේ තොරතුරු සහ ක්‍රමවේදයයි. සංවර්ධිත ආර්ථිකයන් හි ශ්‍රමිකයන්ගෙන් 70%ට වැඩි පිරිසක් තොරතුරු ශ්‍රමිකයන් ය. කර්මාන්තශාලා සේවකයන් වැඩි දෙනෙක් ඔවුන්ගේ දෑතට වඩා හිස ප්‍රයෝජනයට ගනිති. එනම් මෙහි පෙර දැක්වූ හස්ත ශ්‍රමිකයා අභිමානවත් ඥාන හෙවත් දැනුම ශ්‍රමිකයා නැගී සිටියි.

- නව මාධ්‍ය - නව මාධ්‍ය මගින් දැනුම නිෂ්පාදනය සහ බෙදා හැරීම වැඩිවෙයි. එමගින් 'සමූහ බුද්ධිය' (Collective intelligence) නිර්මාණය වෙයි. නිෂ්පාදනය වේගවත් වෙයි. සමස්ත ක්‍රියාවලියම කාර්යක්ෂම වෙයි.

- පරිගණක ජාල - අන්තර් ජාලය වැනි නවීකරණයන් ඔස්සේ 'ගෝලීය ගම්මානය' වඩාත් ආසන්න වෙයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය, විකිණීම, මිලයට ගැනීම සහ බොහෝ විට ගෙනැවිත් භාරදීම ද ඉලෙක්ට්‍රොනික ජාල ඔස්සේ සිදුවනු ඇත.

**විශේෂ ලක්ෂණ (Characteristics)**

දැනුම ආර්ථිකයෙහි ලක්ෂණයක් වනුයේ හිඟතාව (Scarcity) නොව බහුලතාව (Abundance) ය.

අනෙකුත් සම්පත් ප්‍රයෝජනයට ගැනීම මගින් හීන වෙයි. එහෙත් තොරතුරු සහ දැනුම භාවිතය ඔස්සේ තව තවත් වර්ධනය වෙයි.

දැනුම තැන්පත්ව පවතින ස්ථානය ගැටලුවක් නොවේ. නව තාක්ෂණය ඔස්සේ, පහසුවෙන් ප්‍රවේශ විය හැකි ය.

ජාතික පදනමක් මත පමණක් පිහිටා, නීති බාධක, සහ මිනුම් ක්‍රම ප්‍රයෝජනයට ගැනීම දුෂ්කර ය.

බාධක නොතකා ඉල්ලුම වැඩි තැනට දැනුම සහ තොරතුරු ''කාන්දු වෙයි''

මිල කිරීම සහ අගය තීරණය වන්නේ සන්දර්භය අනුව ය. එකම තොරතුරු හෝ දැනුම විවිධ ජනයාට විවිධ මට්ටමින් අගය වෙයි. එකම පුද්ගලයාට වුව ද, එකම තොරතුරු හෝ දැනුම විවිධ අවස්ථාවන්හි දී විවිධ අගයෙන් යුතුවෙයි.

දැනුමෙහි අගය වැඩි වන්නේ මිනිසුන්ගේ හිස් තුළ තිබිය දී නොව, පද්ධති සහ ක්‍රියාවලී තුළට කැවූ විට ය.

මානව ප්‍රාග්ධනය - නිපුණතා - දැනුම මූලික ආයතනයන්ගේ වටිනාකමෙහි ප්‍රධාන අංගයකි. එහෙත් බොහෝ ආයතනයන් හි වාර්ෂික වාර්තාවන්ට නිපුණතා මට්ටම් ඇතුළත් නොවෙයි. අනිත් අතට පිරිවැය අඩුකිරීමේ ක්‍රමයක් ලෙස නිපුණතා මට්මට පහත දමා

පෙන්වීම බොහෝ විට සිදුවෙයි. දැනුම ගලනයට සන්නිවේදනය ඉතා වැදගත් ය. එහෙයින් සමාජ සම්බන්ධතා කෙරෙහි බලපාන සමාජ ව්‍යුහ සංස්කෘතික සන්දර්භ සහ වෙනත් සාධක දැනුම ආර්ථිකයන් හි විශේෂ තැනක් ගනී.

දැනුම ආර්ථිකය ව්‍යාප්ත වූ විට මිනිසුන්ගේ කල්පනා (Ideas) පවා වෙළඳ භාණ්ඩ වනු ඇත.

**ශ්‍රී ලංකාව දැනුම ආර්ථිකයට සම්බන්ධ වීමට නම්**

දැනුම ආර්ථිකය යනු නිශ්චිත සහ අවිනිශ්චිත වටිනාකම් ජනනය කිරීම සඳහා දැනුම ප්‍රයෝජනයට ගැනීම ය. මානව දැනුමෙන් කොටසක් යන්ත්‍ර වෙත සම්ප්‍රේෂණය කිරීමට තාක්ෂණය, විශේෂයෙන්ම දැනුම තාක්ෂණය උදව් වෙයි. තීරණ ආධාරක ක්‍රම මගින් විවිධ ක්ෂේත්‍ර තුළ මෙම දැනුම ප්‍රයෝජනයට ගෙන ආර්ථික වටිනාකම් උත්පාදනය කළ හැකි වෙයි. තාක්ෂණය නොමැති ව ද දැනුම ආර්ථිකය පැවතිය හැකි ය.

කෘෂිකර්මය මූලික ආර්ථිකය සහ ශ්‍රමය මූලික ආර්ථිකයට අමතරව, ගෝලීය ආර්ථිකය ''දැනුම ආර්ථිකයක්'' වෙතට සංක්‍රාන්ති වෙමින් පවතියි. ඒ වනාහි නවීකරණය (Innovation) මගින් මෙහෙයවනු ලබන ''තොරතුරු යුගයෙහි'' පවත්නා ''තොරතුරු සමාජයෙහි'' දිගුවක් ලෙස දැකිය හැකි ය. අද පවත්නේ අන්තර් සම්බන්ධනය වූ ද, ගෝලීයකරණය වූ ද, ආර්ථිකයකි. අනෙකුත් ආර්ථික සම්පත් සේම, වෙළෙඳ රහස් සහ විශේෂඥ දැනුම වැනි සම්පත් ද සාර්ථකත්වය නිර්ණය කළ නියමයන් සහ භාවිතය ගැන යළි සලකා බැලිය යුතුව පවතී.

දැනුම ආර්ථිකයෙහි ප්‍රධාන සංකල්පයන් වනුයේ, දැනුම සහ අධ්‍යාපනය (බොහෝ විට, ''මානව ප්‍රාග්ධනය'' ලෙස හැඳින්වෙයි) පහත සඳහන් දෙකින් එකක් ලෙස සැලකිය හැකි බව ය.

- වෙළෙඳ ව්‍යාපාරික භාණ්ඩයක් ලෙසඃ අධ්‍යාපනික සහ නවීකෘත බුද්ධිමය නිෂ්පාදන සහ සේවාවන්, ඉහළ ආර්ථික වටිනාකමක් සහිත ප්‍රතිලාභ සහිතව අපනයනය කළ හැකි හෙයිනි.

- එලදායී සම්පතක් ලෙසඃ දැනුම ආර්ථිකයක ප්‍රධාන සංරචකය වන්නේ, භෞතික ආදාන සහ ස්වභාවික සම්පත්වලට වඩා, බුද්ධිමය හැකියාවන් කෙරෙහි විශ්වාසය තැබීම ය.

දැනුම ආර්ථිකය සංකල්පයෙහි පුරෝගාමියකු වන Drucker (1966) තම ග්‍රන්ථයෙහි (The Effective Executive) සඳහන් කරන අන්දමට, හස්ත ශ්‍රමිකයා (Manual Worker) සහ දැනුම ශ්‍රමිකයා (Knowledge Worker) අතර වෙනස මෙසේ ය. හස්ත ශ්‍රමිකයා අතින් වැඩ කර භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කරයි. දැනුම ශ්‍රමිකයා හිසෙන් වැඩකර, අදහස්, දැනුම සහ තොරතුරු නිෂ්පාදනය කරයි.

**පරිණාමය**

ගෝලීය ආර්ථික ප්‍රතිව්‍යුහකරණය තුළ ලෝකය එළඹ ඇති නවතම සංවර්ධන අවදිය දැනුම ආර්ථිකය යි. මෙතෙක්, සංවර්ධිත ලෝකය පසුකර ඇති අවධි මෙසේ ය.

- කෘෂිකාර්මික ආර්ථිකයේ (පූර්ව කාර්මික යුගය) සිට කාර්මික ආර්ථිකය (කාර්මික යුගය) වෙත
- කාර්මික ආර්ථිකයේ සිට පශ්චාත් කාර්මික ආර්ථිකය (පශ්චාත් කාර්මික යුගය)
- පශ්චාත් කාර්මික ආර්ථිකයේ සිට දැනුම ආර්ථිකය වෙත

මෙම නවතම අවදියෙහි විශේෂ ලක්ෂණ වන්නේ, තාක්ෂණික නවීකරණයේ පෙරළී, සහ පර්යේෂණ ප්‍රජාවේ මූලිකත්වය ඇතිව නව භාණ්ඩ සහ ක්‍රියාවලී සඳහා ගෝලීය තරඟයයි. මෙම දැනුම ආර්ථිකය තුළ ක්‍රියාකාරී ශ්‍රම හමුදාව පරිගණක සාක්ෂරතාවෙන් යුක්ත ය. දත්ත පරිහරණයෙහි මනා පුහුණුවක් සහිතය, ක්‍රියාවලි සහ පද්ධතීන් නවීකරණයෙහි සමත් ය.

**මෙහෙයුම් බලවේග**

විචාරකයන්ට අනුව මෙම නවතම අවදියෙහි මෙහෙයුම් බලවේග වන්නේ, මේවා ය.

- ගෝලීයකරණයඃ වෙළෙඳ පොළ සහ නිෂ්පාදිතයන් වඩාත් ගෝලීය ස්වභාවයක් ගනී.
- තොරතුරු තාක්ෂණයඃ මෙය පහත සඳහන් බලවේග හා සම්බන්ධ වේ.
- තොරතුරු/දැනුම තීව්‍රතාව :- කාර්යක්ෂම නිෂ්පාදනයට මුල්වන්නේ තොරතුරු සහ නව ක්‍රම ය. ශ්‍රමිකයන්ගෙන් 70%ට වඩා තොරතුරු ශ්‍රමිකයන්ය. බොහෝ කර්මාන්තශාලා සේවකයන් උපයෝගි කරගන්නේ දැතට වඩා මොළය යි.
- නව මාධ්‍යඃ නව මාධ්‍ය නිසා දැනුම නිෂ්පාදනය සහ බෙදාහැරීම ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලය නම් සමූහ බුද්ධිය (Collective Intelligence) වේ. පරිගණක ජාල සහ සම්මත හැකියාව, අන්තර්ජාලය වැනි නව වර්ධනය හේතුවෙන් ගෝලීය ගම්මානය ඉතා ආසන්නයට පැමිණ තිබේ.

**විශේෂ ලක්ෂණ**

දැනුම ආර්ථිකය පහත සඳහන් ප්‍රධාන ලක්ෂණ අනුව, සාම්ප්‍රදායික ආර්ථිකයෙන් වෙනස් වන බවක් පෙනේ.

- ප්‍රයෝජනයට ගැනීම මගින්, බොහෝ සම්පත් ක්ෂය වන නමුදු, තොරතුරු සහ දැනුම හවුලේ භුක්ති විඳීමට හැකි අතර, භාවිතය හේතුවෙන් තව තවත් වර්ධනය වෙයි.
- පිහිටීම හෙවත් ස්ථානගත වීම පිළිබඳ ගැටලුව ලිහිල්ව ඇත. නව තාක්ෂණය ඔස්සේ නිෂ්පාදන ආයතන සහ වෙළඳපොළ අතර දූරස්ථ භාවය ගැටලුවක් වී නැත.
- ජාතික පදනමක් මත, නීති, බාධක බදු සහ මිනුම් ක්‍රම භාවිත කිරීම දුෂ්කර වී ඇත.

- වැඩි දැනුම මූලික වූ භාණ්ඩ සහ සේවා සඳහා, අඩු දැනුම මූලික වූ භාණ්ඩ සහ සේවාවන්ට වඩා ඉහළ මිලක් නියම වෙයි.

- පද්ධති සහ ක්‍රියාවලි තුළ තැන්පත් කෙරෙන දැනුම, මිනිසුන්ගේ හිත් තුළ රඳවා ගෙන හඬ පිටතට ගෙන යන හඬ දැනුමට වඩා ආවේදනික වටිනාකමක් සහිත වේ.

- දැනුම පාදක කරගත් ආයතනයක ප්‍රධාන අගය සංරචකයක් වනුයේ මානව ප්‍රාග්ධනය (දක්‍ෂතා) යි. එහෙත් බොහෝ ආයතන, තම වාර්ෂික වාර්තාවන්හි, දක්‍ෂතා නිවැරදිව සඳහන් නොකරයි. ඒ වෙනුවට ''පිරිවැය කපා හැරීමේ පියවරක්'' ලෙසින් අවතක්සේරු කිරීම සිදු කරයි.

- සන්නිවේදනය ''දැනුම ගලනය'' සඳහා වැඩි වැඩියෙන් යොදා ගැනෙයි.

ශ්‍රී ලංකාව ද නවීකරණයේ ප්‍රවාහයට එක්වීමට පෙරුම් පුරමින් සිටියි. ඒ සඳහා දක්ෂතා සහිත ශ්‍රමිකයන්ගෙන් යුත්, දැනුම පාදක වූ ආර්ථික ක්‍රියාකාරකම්වලට මුල්තැනක් දිය යුතු වෙයි. නිපුණ ශ්‍රමිකයන් අවශ්‍ය වනුයේ නව තාක්‍ෂණය දියුණු කිරීමට පමණක් නොව, පවත්නා තාක්‍ෂණය හඳුනාගෙන, ඒවා නිෂ්පාදනය සඳහා උපයෝගී කරගැනීමට ද නිපුණ ශ්‍රමිකයන් අවශ්‍ය ය. රටෙහි සිටින සුදුසුකම් ලද, දක්‍ෂතා සහිත ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව සීමිත ය. එය ඉහළ නැංවීමට පියවර ගතයුතු වෙයි.

1. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ශ්‍රම බලකාය වියපත් වෙමින් සිටිති. 1990 දී, වයස අවුරුදු 40 ඉක්ම වූ ශ්‍රමික ප්‍රතිශතය 35%කි. 2012 වන විට එය 52% දක්වා ඉහළ ගොස් තිබුණි. එහෙයින්, ශ්‍රී ලංකාවේ පාසල් සහ පුහුණු කිරීමේ ආයතන වෙත පැවරෙන කාර්යය භාරදූර ය. දැනට ද මෙරට පුහුණු වැඩ සටහන් යොමුව ඇත්තේ පාසල් හැරගියවුන් සහ තරුණ පිරිස වෙතට ය. පරිණත ශ්‍රමිකයන් සඳහා පුහුණුවීමේ අවස්ථා නොමැති තරම් ය. තරුණ ශ්‍රම බලකායට ඇතුළු වීමට අකමැත්තක් දක්වන ප්‍රවණතාව තුළ, වැඩිහිටි ශ්‍රමිකයන්ට ද යෝග්‍ය පුහුණුවීමේ අවස්ථා නොමැති විට දී, ශ්‍රම බලකායේ පුළුල් වීමක් සිදු නොවේ.

2. ඉහළ අන්තයේ පුහුණු වීමේ අවස්ථා මෙරට සීමිත ය. පාසල් හැර යන්නන්ගෙන් විශ්වවිද්‍යාලයට ඇතුළු වන්නේ සුළු ප්‍රතිශතයක් පමණකි. වෘත්තීය පුහුණුව ලබන්නන්ගේ ප්‍රතිශතය ද ඉතා සුළු ය. වයස 20-24 දක්වා තරුණ පිරිස අතරින් අධ්‍යාපනයෙහි යෙදෙන්නේ 17% ක් පමණකි. වයස අවුː 25-34 අතර වයස්ගත වූවන්ගේ එම ප්‍රතිශතය 3%කි. වයස අවුː 35-44 අතර පුද්ගලයන්ට අදාළ එම ප්‍රතිශතය 1%ට ද අඩු ය.

3. විද්‍යාව සහ තාක්‍ෂණය ආශ්‍රිත පුහුණු වැඩ සටහන්වලට සහභාගීවීම සඳහා, විද්‍යා-තාක්‍ෂණ පසුබිම් දැනුමක් සහිතව පාසල් අධ්‍යාපනය නිම කරන්නන්ගේ සංඛ්‍යාව ඉතා සීමිත ය. යම් යම් කර්මාන්තයනට අදාළව ශ්‍රමික හිඟයක් පවතින අතර, ඇතැම් අංශවල පුහුණු වැඩසටහන් පුළුල් කිරීමට රජයට සිදුව ඇත. එහෙත්, අවශ්‍ය පූර්ව සුදුසුකම් නොමැති හෙයින් ඒවාට සහභාගී වන සංඛ්‍යාව සීමිත ය. විද්‍යාව සහ ගණිතය සහිත අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාව සැලසෙන්නේ මෙරට සිසුන්ගෙන් ඉතාම සුළු ප්‍රතිශතයකට ය. කනිෂ්ඨ මට්ටමේ දී සිසුන් ලබන විද්‍යා-ගණිත දැනුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැඩි දෙනෙකුට විද්‍යා-ගණිත උසස් අධ්‍යාපනය ලැබීමේ වරම අහිමි වෙයි.

4. සුදුසුකම් සහිත විද්‍යා තාක්‍ෂණ ශ්‍රමිකයෝ වැඩිදෙනෙක් රට හැර යති. අඩු වැටුප් ලැබීම සහ ප්‍රමාණවත් උසස්වීමේ අවස්ථා නොසැලසීම එයට ප්‍රධාන හේතුවකි. වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශගත වන පුද්ගලයන්ගෙන් වැඩි දෙනෙක් ද එම රටවල ම රැඳෙති. තම දරුවන්ට උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීමට අපේක්‍ෂා කරන බොහෝ මව්පියන් ද විදෙස්ගතව ජීවත් වෙති.

ශ්‍රී ලංකාව ද, දැනුම පාදක ආර්ථිකයක් වෙතට ඇදෙන්නට බලාපොරොත්තු වන්නේ නම්, එක්විටම සිදුවිය යුතු බොහෝ දේ ඇත. 1 ශ්‍රේණියේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවිය යුතු ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙත පමණක් වැඩි අවධානය යොමු වන විට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමේ සුදුසුකම් ලබන පාසල් සිසු සංඛ්‍යාව අඩු වෙයි. විද්‍යා-ගණිත අධ්‍යාපනය දියුණු කිරීමට ද, නිර්මාණශීලීභාවය වර්ධනය කිරීමට ද පියවර ගතයුතු වෙයි. අවසාන වශයෙන්, කුසලතා සහිත ශ්‍රමිකයන්

මෙරටම රඳවා ගැනීමට නම්, ආකර්ෂණීය රැකියා අවස්ථා උත්පාදනය කෙරෙන ආයෝජන දිරිගැන්විය යුතු වෙයි.

**වෙනත් යෝජනා**

1. ශ්‍රී ලංකාවේ අනාගතයට පදනම් විය යුත්තේ, වැඩි වැඩියෙන් විදේශ ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීමට සමත්වන අන්දමේ දැනුම මූලික ආර්ථිකයකි.

2. ශ්‍රී ලංකාවේ ආයෝජනයට ඉදිරිපත් වන ව්‍යාපාරිකයන්ට මුහුණ පෑමට සිදුවන එක් අභියෝගයක් වන්නේ, දක්ෂතා සහිත ශ්‍රමිකයන් හිඟවීම ය. එහෙයින් අධ්‍යාපනය ව්‍යුහාත්මකව ප්‍රතිසංස්කරණ කිරීමට ද, අධ්‍යාපනය සඳහා වැඩි මුදලක් වෙන් කිරීම ද අවශ්‍ය ය.

3. කලාපයේ ඉහළ ම සාක්ෂරතා මට්ටම පවත්නේ මෙරටෙහිය. එහෙත් දක්ෂතා සහිත වූ ද, ඉංග්‍රීසි භාෂාව භාවිත කළ හැකි වූ ද, ශ්‍රමිකයන් සොයාගැනීම, විදේශ ආයෝජනයන්ට මෙරට දී මුහුණ පෑමට සිදුවන විශාල අභියෝගයකි.

4. ආසියාවේ අනෙකුත් රටවලට සාපේක්ෂව, මෙරට මානව සම්පත් සැපයුම සීමිත ය. අපි, අඛණ්ඩව අධ්‍යාපනය සලසමින්, සහ දක්ෂතා හුරුකරමින්, අපගේ මානව සම්පත් සංචිතය පුළුල් කළ යුතු වෙයි.

5. විෂයමාලා නැවත සලකා බැලිය යුතු ය. විද්‍යා සහ තාක්ෂණ අධ්‍යාපනයට මුල් තැන දිය යුතු ය. පර්යේෂණ සඳහා වැඩි වැඩියෙන් මුදල් වෙන් කළ යුතු ය.

6. සෑම වර්ෂයකම අ.පො.ස (උ.පෙළ) විභාගය සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාව 200,000 පමණ වෙයි. එහෙත් ඔවුනතරින් විශ්වවිද්‍යාලයට ඇතුළු වීමේ වරම ලබන්නේ 25,000ක් වැනි සුළු සංඛ්‍යාවකි. රාජ්‍ය විශ්වවිද්‍යාල 17 ක් මෙරට පවතින අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් උපාධි ප්‍රදානය කිරීමේ අවසරය දෙන ලද වෙනත් උසස් අධ්‍යාපන ආයතන 18ක් ද වෙයි.

7. දැනුම යනු ප්‍රබල ධනය මවන්නෙකි. එහෙත් තනිවම එය නිර්මාණය කිරීම පහසු නැත. එහෙයින් පෞද්ගලික අංශයේ සහයෝගීත්වය සඳහා දොරටු විවෘත කළ යුතුව පවතී.

**දැනුම ආර්ථිකය හා උසස් අධ්‍යාපනය**

මානව ඉතිහාසයේ ආරම්භයේ සිට ම, තරඟකාරිත්වය ඔස්සේ, නව දැනුම සහ නවීකරණ, සංවර්ධනයට අදාළව ඉතා වැදගත් භූමිකාවක් ඉටු කර ඇත. කෙසේ වුව ද, ඉකුත් දශක කිහිපය තුළ හටගත් ගෝලීයකරණය සහ තාක්ෂණික විප්ලවය ද, සමග ම, දැනුම ආර්ථික සංවර්ධනයේ ප්‍රධානතම මෙහෙයුම්කාරකය බවට පත්ව තිබේ. දැනුම පාදක ආර්ථිකයන් සහිත රටවල්, උදාවූ අවස්ථාවන්ගෙන් කඩිනම් ප්‍රයෝජනය ලබා ගනිමින්, ඉහළ වර්ධන වේගයක් සහ වැඩි ඵලදායීතාවක් අත්කරගෙන ඇත. යුරෝපයෙහි, කුඩා සහ ප්‍රධාන ආර්ථිකයන්, දැනුම, පාදක වර්ධනයෙහි ආදර්ශ බවට පත්ව ඇත. තරඟකාරී උසස් අධ්‍යාපන පද්ධතිය ඔස්සේ ලබා ගන්නා දැනුම පාදක වූ මානව සම්පත් දියුණුව නිසාම, චීනය සහ ඉන්දියාව වැනි රටවල් අද දැනුම ආර්ථික බලපාමින් සිටියි. සාමය යළි අත්වීමත් සමගම, නව දැනුම ඔස්සේ මානව සම්පත් සංවර්ධනය, මෙරට ද ප්‍රමුඛස්ථානයට පත්වෙමින් තිබේ.

ගැටුමට ප්‍රධාන හේතුවක් වන්නේ, බුද්ධිමය දරිද්‍රතාව (Intellectual Poverty) වේ. එවැනි ගැටුමට විසඳුම විය හැක්කේ අධ්‍යාපනය ඔස්සේ ආර්ථිකමය බලගැන්වීම ය. දැනුම සහ දක්ෂතා සම්පාදනයේ දී, තෘතීය අධ්‍යාපනයට පැවරෙන කාර්යභාරය ඉතා වැදගත් ය. ග්‍රාමීය අංශය බලගැන්වීම ද, සංහිඳියාව සහ ජාතික සංවර්ධනය ඇතිකර ගැනීම ද පහසුවන්නේ එමගිනි. වේගයෙන් ගමන් ගන්නා දැනුම පාදක ගෝලීය ආර්ථිකයට සම්බන්ධ වීමට නම්, තමන් ද වේගයෙන් ගමන් කළ යුතු බැවි ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වටහා ගැනීම අවශ්‍ය ය. දැනුම ආර්ථිකය වෙතට සාර්ථකව සංක්‍රාන්ති වීම සඳහා, විශ්ව විද්‍යාල මගින්, දැනුම පාදක කරගත් දක්ෂතා සහිත ශ්‍රම හමුදාවක් නිරන්තරව බිහිවෙමින් සිටිය යුතු ය.

මානව සම්පත් සංවර්ධනය උසස් අධ්‍යාපනයේ වැදගත් පදනමකි. දැනුම උත්පාදනය සහ නිර්මාණය කිරීම, දැනුම භාරව

සිටීම සහ එය ශිෂ්‍යයන්ට මෙන්ම ප්‍රජාව වෙත පැවැරීම ද පිළිබඳ කාර්යයන්හි, විශ්වවිද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතන නිරත වෙයි. අධ්‍යාපනය ඔස්සේ ලබාගන්නා දැනුම, පුද්ගලයාට මෙන්ම සමාජයට ද ශක්තිය ගෙන දෙමින්, විශ්වාසයකින් යුතුව, නූතන ලෝකයේ ගෝලීයකරණය වූ අභියෝගයන්ට මුහුණ දීමේ හැකියාව ඇති කරයි. මනාව සකස් කෙරුණු උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග මගින් ගැඹුරු විශ්ලේෂණාත්මක චින්තනය, ධනාත්මක ආකල්ප, දක්ෂතා සහ ගැටලු විසඳීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීමේ කාර්යක්ෂමතාව ද, එමගින් අවසානයේ, සමාජයට ධනාත්මක දායකත්වයක් සිදුකළ හැකි පුද්ගලයෙක් නිර්මාණය කරනු ලබයි. කෙනෙකු ලබා ගන්නා අධ්‍යාපනය, එම පුද්ගලයාගේ පමණක් නොව, සමාජයේ, ජාතීන්ගේ සහ සමස්ත ලෝකයේ ම, යහපත පිණිස වෙයි. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය සලසා දී ඇති අතර, එමගින් සාක්ෂරතාව 95% දක්වා ඉහළ ගොස් තිබේ. එහි ශක්තිය මත පිහිටා ''ආසියාවේ ආශ්චර්යය'' වීමේ ක්‍රමෝපායට ඇතුළත් වියයුතු බලකේන්ද්‍ර අතුරින් එකක් ලෙස දැනුම කේන්ද්‍රය (Knowledge Hub) හඳුනාගනු ලැබ තිබේ.

අධ්‍යාපනය යනු, දක්ෂතා සහ කාර්යක්ෂමතා සංවර්ධනය සඳහා සුවිශේෂී පදනමකි. තෘතීය අධ්‍යාපනය ඔස්සේ දැනුම සහ බහු විෂයානුබද්ධ දක්ෂතා ඇති කිරීම මගින් පුද්ගලයා තවදුරටත් බලගැන්වෙයි. එක් එක් පුද්ගලයින්ගේ මතයට ගරු කිරීම, විශ්වාසය, සහ කණ්ඩායම් හැඟීම ආදි හර කාවද්දනු ලබන්නේ ද අධ්‍යාපනය මගිනි. රටක ජාතික සංවර්ධනය සඳහා උගත් බුද්ධිමතුන් බිහි කිරීම අවශ්‍ය ය. මෙම සන්දර්භය තුළ, බහුමාධ්‍ය ප්‍රවේශ ක්‍රමයක් සහිත, අඛණ්ඩ පාඨමාලා පවත්වන, ප්‍රායෝගික සරසවි අංශයක් පිහිටුවීමේ කාර්යයෙහි කොළඹ සරසවිය නිරතව සිටියි. එමගින්, විශේෂයෙන් ශ්‍රී ලංකාවට ද, පොදුවේ සමස්ත ජාත්‍යන්තර ප්‍රජාවට ද, පවත්නා තෘතීය අධ්‍යාපනයේ අඩු පාඩු සපුරා ගැනීමේ අවස්ථාවක් සැලසෙනු ඇත. කොළඹ සරසවිය, දැනට ම ද, Cisco-networking Academy හි සහ Microsoft ICT Advanced Academy හි ගෝලීය පන්තිකාමර (Global Classrooms) සමග සම්බන්ධනය වී සිටියි. ඒ හා සමාන ජාත්‍යන්තර වෘත්තීය සහතිකකරණ ක්‍රමයක් සඳහා, ගෝලීය පන්ති කාමර (Global Classrooms) සමග ද, සහයෝගීතාවක් ක්‍රියාත්මක කෙරෙයි. මානව සම්පත්හි වෘත්තීය දියුණුව සඳහා, විශ්වවිද්‍යාල සහ

අධ්‍යාපනයට අදාළ ආයතන අතර මෙබඳු සහයෝගීතාවන් අතිශයින් ම වැදගත් වේ.

## සමාලෝචනය

අධ්‍යාපනය ඔස්සේ ලද දැනුම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවෙහි සමාජ ආර්ථිකය කැපී පෙනෙන අයුරින් වර්ධනය වූ අන්දම පෙන්වන එක් නිදර්ශනයක් ගනිමු. කෙසෙල් වගාවට අදාළව කොළඹ සරසවිය මගින් හඳුන්වා දෙන ලද පටක වර්ධක තාක්ෂණය (Tissue culture technology) ග්‍රාමීය ගොවි ජනතාව විසින් සාදරයෙන් පිළිගනු ලදුව, ඔවුන්ගේ ආදායම අට ගුණය සිට දස ගුණය දක්වා වැඩි කිරීමට සමත් වී තිබේ. මෙය නිරීක්ෂණය කළ කොළඹ සරසවිය එහි ''කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය'' (Institute for Agro Technology and Rural Sciences) මගින්, ග්‍රාමීය ජනතාව ඉලක්ක කරගත්, (On-Line) අඛණ්ඩ කෘෂී තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාවක් ද හඳුන්වා දෙනු ලැබීය. ඊට පෙර, පරිගණකයකට අත තබාවත් නොතිබුණු ග්‍රාමීය ජනයා, ඉතා උනන්දුවෙන් එම පාඨමාලා හදාරා සමත් වූහ. ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය මගින් අත් කරගත හැකි යහඵල මෙම නිදර්ශනයෙන් මනාව පැහැදිලි වෙයි. තෘතීය අධ්‍යාපනය හදාරා, දැනුම ලබා ගනිමින්, එය ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීමට මිනිසුන්ට වුවමනා ය. දැනුම ආර්ථිකය සඳහා ඉහළ විභවයක් ශ්‍රී ලංකාව සතුව ඇත යන්න මෙයින් නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අබේපාල, රෝලන්ඩ් (2020). *තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපනයේ නව ප්‍රවණතා ගැටලු*. සාර ප්‍රකාශන, කොට්ටාව.

අබේපාල, රෝලන්ඩ් (2018). *සමකාලීන අධ්‍යාපන සංකල්ප*. සාර ප්‍රකාශන, කොට්ටාව.

අබේපාල, රෝලන්ඩ් (2022). *21 වන සියවස සඳහා පශ්චාත් නූතන අධ්‍යාපනය*. (මුද්‍රණයේ) සාර ප්‍රකාශන, කොට්ටාව.

Kariyawasam, C. (2021). *Educating the Sri Lankan for the New Era*. Sarasavi Publishers(Pvt) Ltd.

Bhaskar Chatterjee(2011). *Education for all the Indian Saga*. Published by Lotus Press.

Graro, mohanlal (2019). "Mismatch between the Education system and the job market in Srilanka with special reference to soft skills"

Howard Gardner (2011). *Truth, Beauty and Goodness*. Reframed New York 10016.

Rotherham, A.J. & Wilingham, D. (2009). *21st Century skills: the challenges ahead*. Educational leadership.

Sedere M Upali. (2019). First Edition, *Education Meeting Know I ledge Economy*. White Falcon Publishing.

**Web Site:**

21st Century Learning Skills and Strategies, Written by Lakshmi Annapuma Chintaluri, independent Education Consultant.

21st Century standards and Curriculum: Current Research and Practice, Dr. Patrick McGuire.